සැ. යු. - 2013.01.11 වැනි දින පළවූ අංක 1793 දරන ගැසට් පත්‍රයේ III හා IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,794 - 2013 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2013.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 66 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 66 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 71 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 පෙබරවාරි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජනවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනය

ද්විත්ව මාර්ග ඉදිකිරීම් සඳහා කළුතර සිට කටුකුරුන්ද දක්වා එළිපෙහෙළි කිරීම සහ මුල් උදුරා බිම් සකස් කිරීම, මතුපිට පස් ඉවත් කිරීම, පස් පිරවීම සහ සනවත් කිරීම, ඒබීසී ඇතිරීම සහ සනවත් කිරීම සහ කළු ගල් ඇතිරීම සහ මාර්ගය සැකසීම සඳහා වන ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F 7000

1. ද්විත්ව මාර්ග ඉදිකිරීම සඳහා කළුතර සිට කටුකුරුන්ද දක්වා එළිපෙහෙලි කිරීම සහ මුල් උදුරා බිම් සකස් කිරීම, මතුපිට පස් ඉවත් කිරීම, පස් පිරවීම සහ සනවත් කිරීම, ඒබීසී ඇතිරීම සහ සනවත් කිරීම සහ කළුගල් ඇතිරීම සහ මාර්ගය සැකසීම සඳහා මුද්‍රා තබන ලද ලංසු, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් භාරගනු ලබන අතර ලංසු භාරගැනීම 2013.01.24 වැනි දින ප. ව. 2.00 ට අවසන් කෙරේ.

ආපසු ගෙවනු නොලබන රුපියල් තුන් දහසක (රු. 3,000.00) ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2013.01.23 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල ලංසු යොමු කළ යුතු ය.

2. මහාමාර්ග ඉදිකිරීම් හා වාරිමාර්ග හා ඉඩම් ජලාපවහන ක්ෂේත්‍රය සඳහා ඉදිකිරීම්, අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) C 4 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකාවේ ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ (NCCASL) සාමාජිකයින්ට පමණක් ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලැබේ.

3. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගෙවීමකින් තොරව ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකි ය.

4. ලංසු භාරගැනීමේ අවසන් දිනයේ සිට අවම වශයෙන් දින එකසිය විස්සක (120) කාල සීමාවක් සඳහා ලංසු වලංගු විය යුතු ය.

5. රු. 300,000.00 (රුපියල් ලක්ෂ තුනක) ක වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් ලංසු සමග අමුණා එවිය යුතු යි.

6. ලංසු භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලැබෙන පරිදි මුද්‍රා තබන ලද ලංසු, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය සේවා මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10, යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදිය හැකි ය.

7. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය සේවා මූලස්ථානය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති තැනගේ කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ඇරයුම් කෙරේ.

8. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 2438078 හෝ 2436818 ඔස්සේ දුම්රිය ගබඩා අධිකාරි තැන වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F 7000

01-578

---

# රජයේ නොවන දැන්වීම්

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ග්‍රීන් ලංකා කොස්මෙටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 86538
සංස්ථාගත කළ දිනය : 2012.06.14
ලියාපදිංචි කාර්යාලය : අංක 08, තක්කියා පාර, පෝරුතොට, කොච්චිකඩේ.

ලේකම්.

01-569

## වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ගිෆිටි (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 90134
ලියාපදිංචි කළ දිනය : 2012.12.24
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 375/9, පරණ කොට්ටාව පාර, නුගේගොඩ.

ගිෆිටි (පීවීටී) එල්ටීඩී සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී
සමාගම් ලේකම්වරුන්.

2013 ජනවාරි මස 04 වැනි දින.

01-567

---

## වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : මෙල්ස්ටා ටවර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90157
ලියාපදිංචි කළ දිනය : 2012.12.24
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10.

මෙල්ස්ටා ටවර් (පුද්ගලික) සමාගම සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී
සමාගම් ලේකම්වරුන්.

2013 ජනවාරි මස 04 වැනි දින.

01-566

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීමයි

සමාගමේ නම : බිස්නස් ලංකා ඒ එන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2012.10.22
ලියාපදිංචි අංකය : පී වී 89008
ලියාපදිංචි කාර්යාලය : අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

කේ. එච්. ගුණවර්ධන මිය,
සමාගම් ලේකම්.

2012 නොවැම්බර් මස 12 වැනි දින.

01-563

---

## ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම

සෙලාන් බැංකුව මගින් බලාත්මක කරන ලද පහත සඳහන් ඇටෝර්නි බලපත්‍ර පහත සඳහන් දිනයන්හි සිට අවලංගු කර ඇති බවත් ඒවා තව දුරටත් වලංගු නොමැති බවත් සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් මහජනයා වෙත දැනුම් දෙනු ලැබේ.

(1) 2009 අප්‍රේල් මස 7 දිනැති කේ. ජී. චන්ද්‍රසිරි, ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍ර අංක 315, 2011 අප්‍රේල් මස 7 වැනි දින සිට අවලංගු කරන ලදී.

(2) 2011 අප්‍රේල් මස 07 දිනැති ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර, ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍ර අංක 1720, 2012 අගෝස්තු මස 2 වැනි දින සිට අවලංගු කරන ලදී.

සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

එන්. එන්. නජුමුඩීන් මිය,
සමාගම් ලේකම්.

2012 දෙසැම්බර් මස 07 වැනි දින,
සෙලාන් බැංකුව,
ලියාපදිංචි අංකය : පි ක්‍යු 9
සෙලාන් ටවර්ස්, අංක 90,
ගාලු පාර, කොළඹ 03.

01-559

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : ටුවර්ස්ලංකා වැකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 90043
ලියාපදිංචි කළ දිනය : 2012.12.19
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 11, කාසියා මාවත, රත්මලාන.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-549/1

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : ඕර්බිටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 90123
ලියාපදිංචි කළ දිනය : 2012.12.24
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 30/14, සාංචි ආරච්චි උද්‍යානය, අළුත්කඩේ, කොළඹ 12.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-549/2

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත විස්තර කර ඇති සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිමු.

සමාගම : හිගාෂි ඔසාකා ලංකා (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 89966
ලියාපදිංචි ලිපිනය : අංක 89/3, මාළිද, කපුගොඩ
ලියාපදිංචි කළ දිනය : 2012.12.14

අණ පරිදි,

ඩී. එම්. සීලරතන,
අධ්‍යක්ෂ.

01-471.

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි

වර්ෂ 2012.11.23 වැනි දින විජ් ඉන්ටිග්‍රේට් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් සමාගමක් අළුබෝමුල්ල, පමුණුගම, අංක 360 හි සංස්ථාගත කර ඇති බවත් එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 89557 බවත් ශ්‍රී ලංකාවාසි ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. විජිත මනම්පේරි,
සමාගම් ලේකම්.

01-476

---

## සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය

සමාගමේ නම : කොළොන්න ටී ෆැක්ට්‍රි (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 90066
සංස්ථාගත කළ දිනය : 2012.12.20
සමාගමේ ලියාපදිංචි ලිපිනය : බොරලන්කඩ, කතුලන්ද, දැරනියගල.

කොළොන්න ටී ෆැක්ටි (පීවීටී) එල්ටීඩී,
සමාගම් අධ්‍යක්ෂ.

2012 දෙසැම්බර් මස 20 වැනි දින.

01-507

---

## සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය

සමාගමේ නම : ද ඉන්දියන් කිචන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 89928
සංස්ථාගත කළ දිනය : 2012.12.13
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 5, ශාන්ත ලූසියා පාර, කොටහේන, කොළඹ 13.

සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්ගලික)
සමාගම් ලේකම්වරු.

2012 දෙසැම්බර් මස 17 වැනි දින,
අංක 96-2/2, මල්වත්ත පාර,
කොළඹ 11.

01-506/1

---

## සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය

සමාගමේ නම : ඇග්රෝ ලංකා ප්‍රොඩියුස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 90086
සංස්ථාගත කළ දිනය : 2012.12.21
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 119 ඒ, ශ්‍රී සද්ධර්ම මාවත, කොළඹ 10.

සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්ගලික)
සමාගම් ලේකම්වරු.

2013 ජනවාරි මස 01 වැනි දින,
අංක 96-2/2, මල්වත්ත පාර,
කොළඹ 11.

01-506/2

---

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : අලන්කා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2012.12.19
3. සමාගමේ අංකය : පී. වී. 90002
4. ලියාපදිංචි ලිපිනය : අංක 253/1, ගාලු පාර, කොළඹ 04
5. අධ්‍යක්ෂක : වයි. ආර්. විජේසිංහ.

01-505

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගමේ නම වෙනස් කළ බවට මෙයින් දන්වමු.

පෙර භාවිතා වූ නම : බුටානි කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 77699
ලියාපදිංචි කාර්යාලය : අංක 504/1, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-531

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

සමාගම සංස්ථාපනය කිරීම

සංස්ථාගත කළ දිනය : 2008.03.11
සමාගමේ නම : ෆාමර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 63379
ලියාපදිංචි ලිපිනය : අංක 39, සේන්ට් මයිකල්ස් පාර, කොළඹ 03.

කෝපරේට් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ටඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-462/1

### නම වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

ෆාමර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2008 ඔක්තෝබර් මස 08 වැනි දින සිට බලපවත්වන පරිදි එහි නම පාමර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙසින් වෙනස් කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ විස්තර මෙසේ ය.
ලියාපදිංචි අංකය : පී වී 63379
ලියාපදිංචි ලිපිනය : අංක 39, සෙන්ට් මයිකල්ස් පාර, කොළඹ 03

කෝපරේට් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් ඇන්ටඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-462/2

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2012 දෙසැම්බර් මස 20 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : එස්. ජී. ඇකඩමි ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 90070
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 106, ආර්නෝල්ඩ් රත්නායක මාවත, කොළඹ 10

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

01-466

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2012 දෙසැම්බර් මස 05 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඉසුරු ලොජිස්ටික් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 89766
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 113, රබර්වත්ත පාර, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම

01-465

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : කලිප් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 88572
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 243 2/1, හැව්ලොක් පාර, කොළඹ 06
සංස්ථාපනය කළ දිනය : 2012.10.11

එම්. එම්. ජිෆ්රි,
සමාගමේ ලේකම්.

01-445

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : නයිල් ග්‍රීන් හර්බල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 89583
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ආයුර්ධා, අංක 39, මල්වත්ත පාර, ඩී. බී. වේරගල මාවත, හෝකන්දර දකුණ
සංස්ථාපනය කළ දිනය : 2012.11.26

දීපිකා ආරියරත්න,
සමාගමේ ලේකම්.

01-446

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : අයිකොන් කෙස්ට්‍රල් ඇග්‍රො සර්විසස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 89529
ලියාපදිංචි ලිපිනය : අංක 9, තිඹිරිගස්යාය ප්ලේස්, කොළඹ 05

සමාගමේ නම : ඇග්‍රිකෝල් හොල්ඩිංස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 89469
ලියාපදිංචි ලිපිනය : අංක 151/එච්, කුඩහකපොළ (උතුර) ජාඇල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පට්ටගේ විජිර සමන්ත ප්‍රනාන්දු.

01-432

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ:

සමාගමේ නම : සන්රයිස් බිල්ඩර්ස් ඇන්ඩ් ඩිවලොපර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 90149
ලියාපදිංචි ලිපිනය : අංක 299, ගාලු පාර, කොළඹ 03

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩි සොලිටියෝ (පුද්ගලික)
සමාගම් ලේකම්වරු.

01-430

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ:

සමාගමේ නම : එම් ඇන් එස් ට්‍රැවල් සොලියුෂන් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 69633
ලියාපදිංචි ලිපිනය : අංක 588/55, හැව්ලොක් පාර, කොළඹ 06.

සමාගමේ නම : සේෆ් ඕෂන් මැරිටයිම් සර්විසස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 89280
ලියාපදිංචි ලිපිනය : අංක 18/179 බී, දඹරේ මාවත, කොළඹ 05

සමාගමේ නම : ක්‍රිස්ප් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 88347
ලියාපදිංචි ලිපිනය : අංක 299, ගාලු පාර, කොළඹ 03.

සමාගමේ නම : හැටන් නර්සින් හෝම් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 88427
ලියාපදිංචි ලිපිනය : අංක 588/275, දිම්බුල්ල පාර, හැටන්.

සමාගමේ නම : මේකර්ස් පාමා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 88896
ලියාපදිංචි ලිපිනය : අංක 70/8, ජයරත්න පාර, මීගමුව.

සමාගමේ නම : ලෙක්ස්පෝර්ට් ටී ෆැක්ටරිය (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 88428
ලියාපදිංචි ලිපිනය : බණ්ඩාර වත්ත, පහලගලාතුර, කිරිඇල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපර්රේට් ඩී සොලිෂියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

01-431

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගුරුදෙණිය, මාළිගාතැන්න පදිංචි සෙවෙන්තියා පිල්ලෙයි ධනරාජා වන මා විසින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එෆ්. එම්. සවාහිර් මහතා විසින් ලියා සහතික කළ අංක 2136 සහ 2006 ජුනි මස 21 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මහනුවර, පේරාදෙණිය පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, අංක 200/18 හි පදිංචි තයාලන් චන්ද්‍රජ්ගරන් හෙවත් තයිලන් පිල්ලෙයි චන්ද්‍රසේකරන් යන අය මාගේ ඇටෝර්නි බලකරු ලෙස කරන ලද පත් කිරීම අවලංගු කරන බව ද, ඉහත කී අංක 2136 දරන ඇටෝර්නි බලපත්‍රය අද දින සිට බල රහිත බව ද, ඒ යටතේ කරන ලද ක්‍රියාවන් කටයුත්තන් සම්බන්ධයෙන් මා විසින් වගකීම නොදරන බව මහජනතාවට සහ ශ්‍රී ලංකා රජයට මෙයින් දැනුම් දෙමි.

01-424

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : සෙබ්‍රිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 61488
ලියාපදිංචි කාර්යාලය : අංක 28 1/1, පළමු පටුමග, රත්මලාන
ලියාපදිංචි දිනය : 2007 සැප්තැම්බර් 14.

සමාගමේ ලේකම්වරු.

01-421

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : බී. ඒ. පියසේන ග්‍රෑප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 61653
ලියාපදිංචි කාර්යාලය : අංක 75/4, දුම්රියපොල පාර, හෝමාගම
ලියාපදිංචි දිනය : 2007 ඔක්තෝබර් 09.

සමාගමේ ලේකම්වරු.

01-420

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොච්චිකඩේ, දලුවකොටුව, "සුහද සෙවනෙහි" පදිංචි වර්ණකුලසූරිය සුරීනා කල්‍යාණි ප්‍රනාන්දු වන මම දේශබන්දු වික්‍රමසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 19161 දරන ඇටෝර්නි බලපත්‍රය මත කොච්චිකඩේ, දළුවකොටුව, මඩම පාර, අංක 531/1 හි පදිංචි දිසානායකගේ නිලියා දමයන්ති ද සිල්වා යන අයට දෙන ලද ඇටෝනි බලය මෙයින් අවලංගු කරමි.

වර්ණකුලසූරිය සුරීනා කල්‍යාණි ප්‍රනාන්දු,

සුහද සෙවන,
දළුවකොටුව,
කොච්චිකඩේ.

01-417

### ඇටර්නි බලය අවලංගු කිරීම

ඩුබායි, සාජා තැපැල් පෙට්ටිය 10477 හි සේවය කරන මා කොළඹ 12 ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. සෙනෙවිරත්න විසින් සහතික කළ අංක 3134, 2012 ජූනි 21 වැනි දින දරන ඇටර්නි බලකරය මගින් කොළඹ 15, අලුත් මාවත පාර, සැන්ට් ජේම්ස් තට්ටු නිවාස සංකීර්ණය, අංක බී/1/4, පදිංචි අබ්දුල් රහුමාන් රහුමත්තුල්ලා මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කළ අතර එකී පත්කිරීම මා මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් දැනුම් දෙමි.

එම නිසා අබ්දුල් රහුමාන් රහුමත්තුල්ලා මාගේ ඇටර්නි බලකරු ලෙස මා විසින් සහ/හෝ මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මා වග නොකියන බව මෙයින් දැනුම් දෙමි.

කාදර් සහිබ් හලිමා බී. බී.

01-416

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීමයි

ඩබ්ලිව්. පී. එස්. එල්. විතාරන,
ගිණුම් අංක : 0025 5002 7022.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009ක් වූ මාර්තු මස 13 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 38284 ප්‍රකාර රුපියල් නමලක්ෂ තිස්දහස් හයසිය හැත්තෑ අටයි ශත හතලිස් හයක (රු. 9,30,678.46) මුදලක් 2009 ජනවාරි මස 06 වැනි දින සිට අංක 38284 දරන බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අට ලක්ෂ පහළොස් දහස් හයසිය අසූතුනයි ශත හැට තුනක (රු. 8,15,683.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.03 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ, 2009.08.25 වැනි දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.02.06 වැනි දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර උඩුගොඩ උඩසිය පත්තුවේ කොහොලන්වෙල පිහිටි ඇල්හේන කනත්ත කැටකලගහ මුල්ලහේන යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. වී. සිරිසුමන යන අය විසින් සාදන ලද 2004 ජනවාරි මස 26 දාතම හා අංක 4685 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් ඊසානට: දඹුල්ල සිට මාතලේ දක්වා දිවෙන මාර්ගය, ගිණිකොණට : නන්ද සිල්වා යන අය විසින් වර්තමානයේ හිමිකම් කියන දම්මන්හේන වෙන් කරන කම්බි සහ පැළඉනි වැට, නිරිතට : බර්නි වීරසිංහ යන විසින් වර්තමානයේ හිමිකම් කියන ඇල්හේන කනත්ත වෙන් කරන කම්බි සහ පැළඉණි වැට සහ වයඹට : අංක 4685 පිඹුරේ ලොට් 1 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් 3 පර්චස් දහ තුනක් (අ. 0 රූ. 3 පර්. 13) විශාල ඉඩම් කොටස සමග වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද වෙළුම/පත්ඉරුව ඩී 477/214 හි මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-579/1

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. ඒ. ටී. ආර්. ද සිල්වා සහ එම් ඒ එස් ද සිල්වා,
ගිණුම් අංක : 1025 5007 4645.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ජනවාරි මස 25 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දස ලක්ෂ හතලිස් හතර දහස් දෙසිය තිස් හතරයි ශත අසූ පහක (රු. 10,44,234.85) මුදල ද, 2006 නොවැම්බර් මස 08 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ අනූ හය දහස් හතලිස් අටයි ශත පනස් නමයක (රු. 7,96,048,59) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා

පරිශ්‍රයන් 2010.08.13 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ, 2007.06.22 වැනි දින "දිවයින" සහ " තිනකුරල් " සහ " අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.02.06 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාවන් තුළ දැන් වරිපනම් අංක 170 දරන නාගොල්ල හි පිහිටි මොයිසේ ක්‍රෙසන්ට් කොට්ඨාසයෙන් (කටුවේගෙදර එස්ටේට් හි කොටසක්) මාතලේ බලයලත් මානක තැන එස්. රංචාගොඩ යන අය විසින් සාදන ලද 1985 නොවැම්බර් මස 09 දාතම හා අංක 1428 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් නිරූපිත ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 1, නැගෙනහිරට : මහ නගර සභා පාර, වරිපනම් අංක 168 දරන එම ඉඩමේ ඉතිරි කොටස දකුණට සහ බස්නාහිරට මහ නගර සභා පාර සහ මහ නගර සභා 2 වැනි මාර්ගය, ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 26.25) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1428 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව A 107/188 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-579/2

---

## මහජන බැංකුව - නිකවැරටිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ, මාගුල් ඕතොට කෝරළේ දියගම ගමේ පිහිටි, සියඹලාගහ වත්ත නමැති ඉඩමට මැන සාදන ලද අංක 1421 සහ 2008.07.07 දිනැති පිඹුරේ කැබලි අංක 01 දරන,

විශාලත්වය (අක් 0, රූඩ් 03, පර්. 11)ක් විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදි සියලු දේත්

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2013.02.07 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* කුරුණෑගල පුත්තලම් පාරේ නිකවැරටිය නගරය පසුකර 82 කි. මී. කණුව අසල ඇති නැබඩෑව හංදියෙන් වමට ඇති රස්නායකපුර පාරේ කි. මී. 1ක් පමණ ගමන් කරන විට හමුවන 2/1 බෝක්කුවට වම්පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිළෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක්),
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මහජන බැංකුව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතු ය.

| | |
|---|---|
| දුරකථන අංක : | 037 - 2220670, |
| | 037 - 2222572, |
| | 037 - 2222453, |
| ෆැක්ස් අංකය : | 037 2225400. |

හිමිකම් හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල් ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලෑල්ල,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 28,
නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.
දුරකථන අංකය : 071-8125581.

01-513

---

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
(පෙර වයඹ සංවර්ධන බැංකුව)

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තිය ලෙස පැවති, වර්තමානයේ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වැනි වගන්තිය, යටතේ බලය පවරන ලද, 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණිය හත්පත්තුවේ උඩපොල ඕතොට කෝරළේ දෙල්ගොල්ල පිහිටි, කටුගම්පොල වත්ත ලෙස හැඳින්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : කුරහන් සේරු අටයි

කුරුණෑගල දිසා අධිකරණයේ නඩු අංක 3747/P දරන බලයලත් මිනින්දෝරු ජී. එස්. පෙරේරා විසින් සාදන ලද 1972 ජූනි මස 27 වැනි දිනැති අංක 362 දරන පිඹුරේ ලොට් අංක 01 M ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 7.25

(බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. නන්දසේන විසින් සාදන ලද 2004 අප්‍රේල් මස 21 වැනි දිනැති අංක 156 දරන පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිය ද සමග)

බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. නන්දසේන විසින් සාදන ලද, කටුගම්පොළ වත්ත ලෙස හැඳින්වෙන, දෙල්ගොල්ල පිහිටි 2004 අප්‍රේල් මස 21 වැනි දිනැති අංක 1526 අංක දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 7.4 (හෙක්ටයාර 0.0178)

එහි පිහිටි නිවස සහ සියල්ල සහිතව ඉහත කී පිඹුරේ දැක්වෙන නිවසේ සිට කුඩාගම පාර දක්වා දිවෙන මාර්ග අයිතිය ද සමග ප්‍රාදේශීය සංවර්ධන බැංකු විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013 පෙබරවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා දින ප. ව. 1.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 2008.11.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, දෙමළ සංශෝධනය සඳහා 2008.12.26 වැනි දින *ගැසට් පත්‍රය* ද, 2009.11.30 වැනි දින දිනමිණ, ඬේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

වෙන්දේසිකරුගේ වෙනස් කිරීම පිළිබඳ දැන්වීම සඳහා 2011.04.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2011.03.30 වැනි දින දිනමිණ, ඬේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*අදාළ දේපළ වෙත පිවිසීම.*- පොතුහැර නගරයේ සිට පොල්ගහවෙල පාරේ ගොඩවෙල මංසන්ධිය දක්වා පැමිණ, වමට ඇති කුඩාගම පාරට හැරී කිලෝමීටර් 1.5ක් පමණ ගොස් වමට හැරී තවත් මීටර් 30ක් පමණ ගිය විට එම පාරේ වම් පැත්තේ අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්) ,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් සම්බන්ධ හෝ වෙනත් යම්කිසි ගාස්තුවක් පවතී නම් එම ගාස්තුව,
6. විකුණුම් සහතිකයට අදාළ මුද්දර බද්ද.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, වයඹ පළාත් කාර්යාලය, අංක 155, මීගමුව පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් ආකාරයට අදාළ දින 30 ඇතුළත ගැණුම් මිලෙහි ඉතිරි මුදල නොගෙවන අවස්ථාවක දී දැනටමත් ගෙවන ලද මුදල (25%) අහිමි කිරීමට සහ අදාළ දේපළ නැවත වෙන්දේසි කිරීමේ අයිතිය බැංකුව සතුයි.

අදාළ දේපළ සම්බන්ධ ඔප්පු සහ අනෙකුත් විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

*දුරකථන අංක* : 037-2227567, 037-2227429, 037-2234350, 037-2234360,
*ෆැක්ස් අංකය* : 037-2220013.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි. "

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 121 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1982.com.

වෙබ් අඩවිය :www.sandslanka.com

01-511

---

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව**
(පෙර වයඹ සංවර්ධන බැංකුව)

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තිය ලෙස පැවති, වර්තමානයේ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වැනි වගන්තිය, යටතේ බලය පවරන ලද, 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ උඩපොළ මැදලැස්ස කෝරළේ, පොතුහැර පිහිටි, බංගලාවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එච්. එම්. එච්. විජේකෝන් විසින් සාදන ලද, 1988 ජනවාරි මස 22 වැනි දිනැති අංක 1036 දරන පිඹුරේ ලොට් අංක 03 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ්. 0, පර්. 14

එහි පිහිටි ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ සියල්ල සහිතව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013 පෙබරවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 2000.07.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2000.07.03 වැනි දින ලංකාදීප, ඬේලි නිවුස් පුවත්පත් සහ 2000.07.10 වැනි දින තිනකරන් පුවත්පත් ද බලන්න.

වෙන්දේසිකරු වෙනස් කිරීම පිළිබඳ දැන්වීම සඳහා 2011.04.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* , 2011.03.30 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*අදාළ දේපළ වෙත පිවිසීම.*- පොතුහැර නගරයේ සිට වදාකඩ පාරේ මීටර් 225ක් පමණ ගිය විට අදාළ දේපළ එම පාරේ දකුණු පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්) ,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසියේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් සම්බන්ධ හෝ වෙනත් යම්කිසි ගාස්තුවක් පවතී නම් එම ගාස්තුව,
6. විකුණුම් සහතිකයට අදාළ මුද්දර බද්ද.

ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, වයඹ පළාත් කාර්යාලය, අංක 155, මීගමුව පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් ආකාරයට අදාළ දින 30 ඇතුළත ගැණුම් මිලෙහි ඉතිරි මුදල නොගෙවන අවස්ථාවක දී, දැනටමත් ගෙවන ලද මුදල (25%) අහිමි කිරීමට සහ අදාළ දේපළ නැවත වෙන්දේසි කිරීමේ අයිතිය බැංකුව සතුයි.

අදාළ දේපළ සම්බන්ධ ඔප්පු සහ අනෙකුත් විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 037-2227567, 037-2227429, 037-2234350, 037-2234360,
ෆැක්ස් අංකය : 037-2220013.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 121 ක සේවා විශිෂ්ඨත්වය සමරමින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1982.com.

වෙබ් අඩවිය :www.sandslanka.com

01-510

**ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී**
(කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ විකිණීම

**අංක 3723 සහ 4705 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ , සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ , පිළියන්දල නගර සභා සීමාවට අයත් මාම්පේ පිහිටි, වෙරළුගහවත්ත හෙවත් අළුබෝගහවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු ඒ. පී. කස්තුරිරත්න විසින් සාදන ලද, 1982 අප්‍රේල් මස 04 වැනි දිනැති අංක 1186 දරන පිඹුරේ ලොට් අංක 10 ලෙස දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ්. 01 , පර්. 32.24

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් වසන්ත ගුණවර්ධන විසින් සහතික කරන ලද, 2005 අගෝස්තු මස 12 වැනි දිනැති අංක 3723 සහ 2008 සැප්තැම්බර් මස 24 වැනි දිනැති අංක 4705 දරන උකස්කරයන් ප්‍රකාර, කොළඹ 05 පදිංචි, මීතලාවේ අළුත්ගමගේ ලංකා බණ්ඩාර ගොඩලියැද්ද යන අය අධ්‍යක්ෂවරයෙකු ලෙසත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නීතිගත වූ ලියාපදිංචි අංක පී වී 14829 දරන සහ එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 05 පිහිටි සී/ස රොජර්ස් ඒජන්සීස් (පුද්ගලික) සමාගමත් (මින්මතු සමාගම ලෙස හැඳින්වෙන) විසින් ඩීඑෆ්සීසී වර්ධන බැංකුව පීඑල්සී ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී, පොරොන්දු නිසියාකාරව, ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013 පෙබරවාරි මස 05 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 1.00 පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්) ,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසියේ කොමිස් මුදල ගැනුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාර),
4. රු. 68,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි. "

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 121 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1982.com.

වෙබ් අඩවිය :www.sandslanka.com

01-509

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාතේ (පළාත් බද) මහාධිකරණයේ දී ය

1. රත්මලාන පරණ ගුවන් තොටුපොළ පාර අංක 03 හි, ශ්‍රී රම්‍ය ප්ලාස්ටික් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ගල්කිස්ස, ගාලු පාර, අංක 228/1, ගොඩේ විතානගේ රම්‍යසිරි වික්‍රමසිංහ

නඩු අංකය : එච්සී(සිවිල්) 33/2008MR

- එදිරිව -

විත්තිකරුවන්.................................

රත්මලාන, ගාලු පාර, අංක 161 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ, කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය, පිහිටි සීමාසහිත සම්පත් බැංකුව නොහොත් සම්පත් බැන්ක් ලිමිටඩ්,

පැමිණිලිකරු............................

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට කියා පැමිණිලිකරුට නියම කරන ලද වර්ෂ 2010ක් වූ මාර්තු මස 03 වැනි දින කොළඹ වාණිජ මහාධිකරණ සමථ කොන්දේසි නඩු තීන්දුව ප්‍රකාර, පැමිණිල්ලේ වාසියට මෙම නඩුව නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද, ඉහත පැමිණිල්ල ඉල්ලා ඇති පරිදි 1 සහ 2 විත්තිකරුවන් විසින් රු. 11,046,854.50 ක මුදලක් සහ 2005.12.31 වැනි දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා රු. 10,653,499.85 ක මුදලක් මත ද, නඩු තීන්දුවේ දින සිට හිඟ මුළු මුදල ගෙවා නිමවන තුරු සමස්ථ මුදල මත ද, 15.5% ක වාර්ෂික පොළියක් සහ එකී පොළිය මත ව්‍යවස්ථාපිත අයකිරීම් ද පැමිණිලිකරුට ගෙවන ලෙසට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද, 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් විසින් රු. 157,269.15 ක මුදලක් සහ 2005.12.31 වැනි දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා රු. 152,346.36 ක මුදලක් මත ද, නඩු තීන්දුවේ දින සිට හිඟ මුදල ගෙවා නිමවන තුරු සමස්ථ මුදල මත ද, 10% ක වාර්ෂික පොළියක් සහ එකී පොළිය මත ව්‍යවස්ථාපිත අයකිරීම් ද පැමිණිලිකරුට ගෙවන ලෙසට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

ඉහත කී සමථ කොන්දේසි නඩු තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2013ක් වූ පෙබරවාරි මස 15 වැනි දින ප. ව. 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ කොට්ඨස අංක 26 "විහාර" හි රත්මලාන දකුණ, රත්මලාන පාරේ වරිපනම් අංක 228/1 හි පිහිටි "ගොරකගහවත්ත" වන ඉඩමට බලයලත් මානක කේ. කේ. තිරුනවුකරාසු මහතා විසින් මැන සාදන ලද අංක 2388 හා 1978.09.30 දින දරන පිඹුර ප්‍රකාර ලොට් සී 2 ඒ දරන ඉඩමට මායිම්: උතුරට : ලොට් අංක සී 1 (අඩි 10ක් පළල පාර) ද, නැගෙනහිරට : රත්මලාන පාර සහ ලොට් අංක සී 2 බී ද, දකුණට : ලොට් අංක සී 2 බී සහ රත්මලාන පාරේ වරිපනම් අංක 236, 236/1, 236/2, 236/3 දරන පරිශ්‍රයෙන් ද, බටහිරට: රත්මලාන පාරේ වරිපනම් අංක 228/3 සහ 228/4 දරන පරිශ්‍රයෙන් ද, සහ බලයලත් මානක ආර්. පී. පෙරේරා මහතා විසින් මැන සාදන ලද අංක සී/24 දරන පිඹුරේ ලොට් අංක සී 1 හි ඉතිරි කොටස ද, මායිම් වූ රූඩ් එකයි පර්චස් හතයි දශම හතරයි දෙකක් (අක්. 0, රූ. 1, පර්. 7.42) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැවිලි ඇතුළු සියලු දෙයත් පහත විස්තර පාරක් සඳහා වෙන් කරන ලද බිම් තීරුවේ මාර්ග පරවසතා අයිතිය ද සමග වේ. (මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2435/222 හි ලියාපදිංචි වී ඇත)

ඉහත කී රත්මලාන දකුණ හි පිහිටි ගොරකගහවත්ත වන ඉඩමේ බලයලත් මානක කේ. කේ. තිරුනවුකරාසු මහතා විසින් මැන සාදන ලද එකී අංක 2388 දරන පිඹුරේ ප්‍රකාර ලොට් සී 1 (අඩි 10 පළල පාරට වෙන් කර බිම් තීරුව) දරන ඉඩමට මායිම්, උතුරට : රත්මලාන පාරේ වරිපනම් අංක 226 දරන පරිශ්‍රය වන ලොට් බී ද, නැගෙනහිරට : රත්මලාන පාර ද, දකුණට : ලොට් සී2ඒ සහ බටහිරට : රත්මලාන පාරේ වරිපනම් අංක 228/3, සහ 228/4 දරන පරිශ්‍රයෙන් ද හා ආර්. පී. පෙරේරා මිනින්දෝරු තැන විසින් මාන සාදන ලද අංක සී 24 දරන පිඹුරේ ලොට් සී 1 දරන ඉඩමේ ඉතිරි කොටස ද, මායිම් වූ පර්චස් හතයි දශම හතරයි හතරක් (අක්. 0, රූ. 0, පර්. 7.44) විශාල ඉඩම වේ. (මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2435/223 හි ලියාපදිංචි වී ඇත)

*ඉඩමට පිවිසීම.* - කොළඹ ගාලු පාරේ, ගල්කිස්ස පොලිස් ස්ථානයට මීටර් 100ක් පමණ මෙපිටින් දකුණු පසට වන්නට ඇති පුද්ගලික පාරේ අඩි 85ක් පමණ ගියවිට අදාළ විෂයය වස්තුව හමුවේ. ඕනෑම කෙනෙකුට අදාළ විෂය වස්තුවට පහසුවෙන් ළඟා විය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම්කරු විසින් විකුණුම මිලෙන් 25%,
02. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු රු. 3,000,
03. සියලුම ප්‍රචාරක වියදම්,
04. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු 2.5%,
05. රජයේ ගාස්තු,
06. ලිපිකරු හා සෝෂක ගාස්තු රු. 2,000.

ඉතිරි 75% ක මුදල දින 30ක් ඇතුළත දී බස්නාහිර පළාතේ (පළාත්බද) මහාධිකරණයේ ඉහත සඳහන් නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

1. උපුල් ගුණතිලක මහතා,
(විධායක නිළධාරී ණය අයකිරීම්),
සම්පත් බැංකුව පීඑල්සී,
අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 02
දුරකථන අංක : 011-4730266,
077-1070766.

2. දිනේෂ් පීරිස් මහතා,
(කනිෂ්ඨ විධායක නිලධාරී ණය අයකිරීම්),
සම්පත් බැංකුව පීඑල්සී,
අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 02
දුරකථන අංක : 011-4730536,
077-3680639

3. කේ. ආර්. මහවිතාන,
තක්සේරුකරු , වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්,
අංක 156 1/13,
අළුත්කඩේ වීදිය,
කොළඹ 12
දුරකථන අංක : 077-3681839

01-427

---

**සෙලාන් බැංකුව පීඑල්සී - පානදුර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීමයි

මෙම දේපළ වාද්දුව පදිංචි හෙට්ටි කංකානම්ගේ මහීපාල පෙරේරා සහ හෙට්ටි කංකානම්ගේ කීර්තිපාල පෙරේරා යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මුනවත්තබාගේ පත්තුවේ, රයිගම් කෝරළේ, පරගස්තොට පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් සාදන ලද 1998.02.02 දිනැති අංක 347 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් කැබලි අංක බී වශයෙන් ලකුණු කළ ගොන්නගහවත්ත කොටසක් හෙවත් පුවක්වත්ත නමැති අක්කර එකක් (අක්. 1, රූ. 0, පර්. 0) විශාල ඉඩම.

ඉහත විස්තර කරන ලද එකී අංක 347 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබලි අංක බී ලකුණු කළ පෙර කී ඉඩම් කොටස පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ මුනවත්තබාගේ පත්තුවේ පරගස්තොට පිහිටි ගොන්නගහවත්ත හෙවත් පුවක්වත්ත නමැති අක්කර තුනයි රූඩ් දෙකක් වූ ඉඩමෙන් නොබෙදූ අක්කර එකක් ලකුණු කළ ඉඩම් කොටස.

ඉහත සඳහන් දේපළ 2013 පෙබරවාරි මස 07 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* මොරන්තුඩුව සිට මිල්ලනියිය පාරේ කි. මී. 2.5ක් ගිය විට ඇති පරගස්තොට හංදියෙන් තවත් මීටර් 100ක් ඉදිරියට ගිය විට හමුවන වම්පස ඇති බොරළු දැමූ ප්‍රදේශීය සභා පාරෙන් මීටර් 300ක් ඉදිරියට ගිය විට දකුණු පස ඇති අඩි 20ක් පළල පාර සැලැස්මේ පෙන්නුම් කරන පරිදි ඉඩමට යැම සඳහා ඇති මාර්ගය වේ.

*යෝජනා සම්මුති දැන්වීම. - රජයේ ගැසට් පත්‍රයේ* 2006.06.09 වැනි දින ද, ලංකාදීප සහ ඩේලිමිරර් යන පුවත්පත්වල 2006.04.27 වැනි දින ද, වීරකේසරි පුවත්පතේ 2006.05.11 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දන 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.-* ප්‍රධාන කළමණාකාරිනිය (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456473, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක 011-3068185, 011-2572940.

01-444

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.